**ශීර්ෂය 300, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**

**------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 300 ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුලි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම.

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | මාර්ගෝපදේශයේ 7.9 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසානයේ වාර්තාකරණ ආයතනය විසින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද රු.2,681,919 ක මුදල් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දෑ හි ශේෂයට ඇතුලත් නොකල යුතු වුවත් එම වටිනාකම ඇතුලත් කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමී. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ රු.402,886 ක VAT පාලන නමින් ශේෂයක් පෙන්නුම් කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ VAT පාලන ගිණුමක් ක්‍රියාත්මක වන බැවින් එය මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ පෙන්නුම් කර ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් කළ යුතු තොරතුරු පමණක් ඇතුලත් කළ යුතුය. |
| **(ඇ)** | මාර්ගෝපදේශයේ 7.8 ඡේදය ප්‍රකාරව අත්තිකාරම් ගිණුම්වල වටිනාකමින් තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ ඇති භාණ්ඩාගාරයට ශුද්ධ වත්කම් අගය ගණනය කළ යුතු වුවත් එසේ ක්‍රියාකර නොතිබුණි. | උක්ත (අ) හි සඳහන් කරුණ හේතුවෙන් මෙම ගැටළුව පැන නැගී ඇති අතර 2023 වර්ෂයේ ගිණුම් නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමී. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 05/2022 ප්‍රකාරව ගිණුම් පිළියෙල කිරීමට වගබලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මාර්ගෝපදේශයේ 7.7 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණවල අගයට සමාන වටිනාකමක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ සංචිතයක් ලෙස දැක්විය යුතු වුවද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි (ඒසීඒ-පී හි) රු 89,119,276ක් වූ කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම අත්තිකාරම් ගිණුම් යටතේ දැක්විය යුතු වුව ද දේපළ පිරියත හා උපකරණ යටතේ එකතු කර දැක්වීම හේතුවෙන් ඒ හා සමාන ප්‍රමාණයෙන් දේපළ පිරියත හා උපකරණ සහ දේපළ පිරියත හා උපකරණ සංචිත ගිණුම් ශේෂයෙහි වෙනසක් නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි කුලී වැඩ හා අත්තිකාරම් යටතේ දැක්වීමට කටයුතු කරමී. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ගිණුම් පිළියෙල කිරීමට වගබලා ගත යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) රජයේ නිලධාරින්ට අතිතිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ආරම්භක හා අවසාන ශේෂ භාණ්ඩාගාර පොත් අනුව ආරම්භක හා අවසාන ශේෂයෙන් රු.332,250 කින් වෙනස් වී තිබුණු අතර කාලයක සිට පැවත එන මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට 2022 දෙසැම්බර් 31 වන විට ද ක්‍රියාකර නොතිබුණි. | මෙම රු 332,249.20.ක වෙනස මෑත කාලීනව සිදු වූ වෙනසක් නොවන අතර පැරණි ලිපිගොනු , පොත් පරීක්ෂා කර බැලීමේදී මෙය 2000 වසරට පෙර සිදු වූ වෙනසක් ලෙස හඳුනා ගෙන ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | වෙනස හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 6000-0-0-016-0-120 දරන තැන්පතු ගිණුමේ ආරම්භක ශේෂය දෙපාර්තමේන්තු පොත් අනුව රු.16,574,196 ක් වුවත් **ACA** 4 ආකෘතියේ එය රු.1,657,419 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව තැන්පතු ගිණුම්වල ආරම්භක ශේෂ එකතුව රු.103,464,394 ක් වුවද **ACA** 4 ආකෘතියේ එය | වැරදීමකින් **ACA** 04 ආකෘතියෙහි 6000-0-016-0-120-0 දරණ තැන්පත් ගිණුමෙහි ආරම්භක ශේෂය 165,719.87 ලෙස දක්වා තිබු නමුත් නිවරදි ශේෂය 16,574,196 විය යුතු වේ. ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පරීක්ෂාකාරී වීමට සටහන් කර ගතිමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පරීක්ෂාකාරීව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

රු.88,547,618 ක් ලෙස රු.14,916,776 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඇ) අග්‍රිම ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත් අනුව අග්‍රිම ශේෂයක් නොතිබුණ ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.2,681,919 ක් ඇතුලත් කර තිබුණි. | භාණ්ඩාගාරයට ප්‍රේෂණය කල මුදල වැරදීමකින් සටහන් කර ඇත. 2023 වර්ෂයේදී ගිණුම් නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 05/2022 ප්‍රකාරව ගිණුම් පිළියෙල කිරීමට වගබලා ගත යුතුය. |

**(ඈ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය ඇස්තමේන්තුව මගින් 1701 වැය විෂය සඳහා ප්‍රතිපාදන සලසාගෙන නොතිබූ අතර මුදල් රෙගුලාසි 66 මාරු කිරීම මගින් එම වැය විෂයය වෙත රු.4,150,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි.මෙම වැය විෂයයෙන් පාඩු සහ කපා හැරීම යටතේ රු.4,129,525 ක් පොත් වලින් කපා හැර තිබුණ ද ඒ පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | භාණ්ඩාගාර විවිධ අත්තිකාරම් ගිණුම (7000/0/0/25003/420) - 2002/2007 වී මිලට ගැනීමේදී ඇතිවූ අලාභය මු.රෙ 109 ප්‍රකාරව කපා හැරීම සඳහා PFD/RED/WO අංක දරණ 2022.01.24 දින පොදු 285 ආකෘතිය මගින් අනුමැතිය ලබා දීඇත. එයට අදාළ තොරතුරු FC/6(1)/4/1 සහල් යන ලිපි ගොනුවේ අන්තර්ගත වී ඇත. | කපා හැරීමට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජූලි 28 දිනැති අංක 01/2021 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.2 (අ) ඡේදය මගින් 2021 ජූලි 01 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව පදනම් කරගෙන 2022 වසර සඳහා වැටුප් වේතන සහ වෙනත් දීමනා එක් එක් අය වෙනුවෙන් වෙන් වෙන්ව ගණනය කළ යුතු බවටත් 2022 | නිලධාරීන් අනුප්‍රාප්තිකයන් රහිතව ස්ථාන මාරුවී ගිය බැවින් එලෙස 1001, 1003 වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වී ඇත. ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ වැය විෂයන් සඳහා එම ඉතිරි මුදල් මාරු කර ගත් බව. | තාත්වික ඇස්තමේන්තු සකස් කිරීමට වගබලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය තුල නව බඳවා ගැනීම් අධෛර්යමත් කරන බැවින් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් නොකරන බවත් දන්වා තිබියදී, ඒ අනුව ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන්, | | |
| | • වැටුප් හා වේතන 1001 වැය විෂයෙන් රු.3,000,000 ක් එනම් සියයට 9 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයන් වෙත මාරු කර තිබූ අතර එම මාරු කිරීම් සිදු කිරීමෙන් අනතුරුව වියදම් දැරීමෙන් පසුව ද රු.1,484,341 ක් එනම් සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 5 ක් ඉතිරි වී තිබුණි. | නිලධාරින් අනුප්‍රාප්තිකයන් රහිතව ස්ථාන මාරුවී ගිය බැවින් එලෙස 1001, 1003 වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වී ඇත. ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ වැය විෂයන් සඳහා එම ඉතිරි මුදල් මාරු කරගත් බව. | තාත්වික ඇස්තමේන්තු සකස් කිරීමට වගබලා ගත යුතුය. |
| | • වෙනත් දීමනා 1003 වැය විෂයෙන් රු.1,100,000 ක් එනම් සියයට 6.9 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයන් වෙත මාරු කර තිබූ අතර එම මාරු කිරීම් සිදු කිරීමෙන් අනතුරුව වියදම් දැරීමෙන් පසුව ද රු.485,905 ක් එනම් සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 3.26 ක් ඉතිරි වී තිබුණි. | නිලධාරින් අනුප්‍රාප්තිකයන් රහිතව ස්ථාන මාරුවී ගිය බැවින් එලෙස 1001, 1003 වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වී ඇත. ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ වැය විෂයන් සඳහා එම ඉතිරි මුදල් මාරු කරගත් බව. | තාත්වික ඇස්තමේන්තු සකස් කිරීමට වගබලා ගත යුතුය. |
| **(ආ)** | 2022 දෙසැම්බර් 13 දිනැති 05/2022 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.4 ඡේදය ප්‍රකාරව වැය විෂයයක මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර වෙනස එම වැය විෂයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 හෝ රු.10,000 යන දෙකෙන් කවර හෝ වැඩි මුදලකට වැඩි වන්නේ නම් වෙනසට හේතු ඉදිරිපත් කල යුතු වුවත් වැය විෂයයන් 09 කට අදාලව වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රමාද දෝෂයකින් ඉතිරි වීම්වලට හේතුන් දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය. |

**2.2** බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 06 ක් සම්බන්ධයෙන් ඉතිරිය ඉක්මවා රු.4,122,969 ක බැදීම් ඇති කරගෙන තිබුණි. | අත්‍යවශ්‍ය වියදම් වෙනුවෙන් එලෙස බැදීම් ඇති කර ගෙන ඇති අතර ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් පරීක්ෂාකාරීවීමට සටහන් කර ගතිමි. | ඉතිරිය ඉක්මවා බැරකම් වලට එළඹීම නොකල යුතුය. |
| (ආ) | බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් වූ රු.99,800 ක් වූ බැරකම් 2 ක් 2023 මාර්තු 30 දින විටත් නිරවුල් කර නොතිබුණි. | ඉන්දියන් සහනාධාර වැඩසටහනට අදාළ වූ වවුචර් වූ බැවින් මේ දක්වා ගෙවීම් සිදුකර නොමැත. | බැරකම් වලට බැඳීමේදී වැය ශීර්ෂය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන අයවැය චක්‍රලේඛයේ xii ඡේදය ප්‍රකාරව සියලුම සුභසාධන හා සහනාධාර වැඩසටහන් නැවත සමාලෝචනය කර ඒවා අත්‍යවශ්‍යයන්ම ලැබිය යුතු අඩු ආදායම්ලාභීන්ට හෝ අත්‍යවශ්‍ය ප්‍රතිලාභීන්ට පමණක් ලබාදීම සිදු කල යුතු බව දක්වා තිබුණෙන් ඒ පිළිබඳ අවධානය යොමු කර සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් නඟා සිටුවීමේ වැඩසටහන යටතේ ප්‍රතිපාදිත රු.50,000,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. එසේ වුවද 300-1-1-4-2506 වැය විෂයට යටතේ බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත රු.30,000,000 ක බැරකමක් දක්වා තිබුණු අතර 2022 වර්ෂයේ ඒ සම්බන්ධ ගිවිසුමකට එළඹීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියාකර නොතිබිය දී 2023 පෙබරවාරි මාසයේදී රු.20,000,000 ක් පමණක් ගෙවා තිබුණි. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මේ සඳහා රුපියල් මිලියන 20 ක මුදලක් පමණක් ලබා දෙන ලදි. ඒ අනුව තවදුරටත් මිලියන 10ක මුදලක් ගෙවිය යුතුව පවතී. ගෙවන ලද මිලියන 20 සම්බන්ධයෙන් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් ලබා ගැනීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් පිළිබඳ ප්‍රකාශය (i) (ඇමුණුම iv)තුල මුදල් රෙගුලාසි 94(2) සහ (3) ප්‍රකාරව බැරකම් වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශයෙහි රු.216,039 ක බැදීමක් පමණක් ඇතුලත් විය යුතු වුවද ඇමුණුම (iii) හි ඇතුලත් රු.4,469,507 ක බැරකම් ද ඇතුලත් කිරීම හේතුවෙන් මු.රෙ 94 (2) සහ (3) | බැරකම් පිළිබඳ ප්‍රකාශය (i) තුළ මු.රෙ 94 (2) (3) ප්‍රකාරව වාර්ෂික පුනරාවර්තනය වන සැපයුම හා සේවාවන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට වගබලා ගත යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රකාරව බැරකම් වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශයේ රු.4,253,468 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| **(ඉ)** ඉන්දියන් ආධාර බෙදා හැරීම හා ලෝක ආහාර වැඩසටහනේ වියදම වෙනත් වැය ශිර්ෂ වන වෙළඳ අමාත්‍යාංශය හා ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ සිදුකර තිබුණ ද බැදීම හා බැරකම් යටතේ එම වැඩසටහන් වලට අදාළ රු.173,883 අතිකාල හා නිවාඩු දින වැටුප් 300-1-1-0-1002 දරන ආහාර දෙපාර්තමේන්තු වැය ශිර්ෂ යටතේ ගෙවා තිබුණි. | එම වියදම් ඉතා ඉක්මණින් ගෙවීම් කල යුතු බැවින් 300-1-1-0-1002 වැය ශිර්ෂය යටතේ සිදු කරන ලදී. ඉදිරියේදී වියදම් දැරීමේදී පරීක්ෂාකාරී වන බවට සටහන් කර ගනිමි. | වියදම් දැරීමේදී වැය ශිර්ෂය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සම්බන්ධිකරණය යටතේ මානුෂිය ආධාර ලෙස ශ්‍රී ලංකාවට පිරිනමනු ලබන සහල් මෙට්‍රික් ටොන් 40,000 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 500 ක් හා ඖෂධ මෙට්‍රික් ටොන් 50 ක් ලබාදීමේ වැඩසටහන අදියර 03 ක් යටතේ ක්‍රියාත්මක කර තිබුණි. මෙම අදියර තුනේදී වරායෙන් භාණ්ඩ නිදහස් කර ගැනීමේ සිට අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ආහාර ද්‍රව්‍ය බෙදාහැරීමේ කාර්යය ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් සිදුකර තිබුණි.මෙහිදී පලමු අදියර සඳහා සහල් මෙට්‍රික් ටොන් 9000 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 50 ක් ද, දෙවන අදියර සඳහා සහල් මෙට්‍රික් ටොන් 14643.95 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 250 ක් ද, තුන්වන අදියර සඳහා සහල් මෙට්‍රික් ටොන් 16356.5 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 200 ක් වශයෙන් ලබා දී තිබු අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සහනාධාර තොග ගබඩා කිරීම හා ගබඩා කුලියට ගැනීම** | | |
| (i) ඉන්දියානු ආධාර බෙදාහැරීම භෞතික පරීක්ෂාවට ලක්කල දිනයේ මරදාන දුම්රිය ගබඩා දෙකෙහිම විශාල ඉඩ ප්‍රමාණයක් ඉතිරිව තිබුණ ද දුම්රියේ ප්‍රවාහනය කිරීමට සැලසුම් කල සහල් තොග මරදාන ගබඩාවේ රඳවා නොගෙන ඔරුගොඩවත්ත ගබඩාවේ ගබඩා කිරීම නිසා නැවතත් මරදාන ගබඩාවට ප්‍රවාහනය කිරීම වෙනුවෙන් 2022 ජූලි 04 දින සිට ජූලි 18 දින දක්වා කාලය තුල රු.1,631,700 ක අතිරේක ප්‍රවාහන වියදමක් දරා තිබුණි. | එකඟවෙමි. ඉදිරියේදී ඔබගේ උපදෙස් අනුව කටයුතු කරමි. | රජයට ඉතාමත් අරපිරිමැසුම්දායීව සේවය ලබාගත හැකි වන අයුරින් කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සහල් ඇසුරුම් කැඩීයාම නිසා ඔරුගොඩවත්ත හා මරදාන ගබඩාවල දෛනිකව එකතු කරන ලද සහල් ද නැවත පිරිසිදු කර ඇසුරුම් කර බෙදාහරින බව සඳහන් වුවද ඒ පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර කැඩුණු සහල් මලු සැකසීම,දුම්රිය ගබඩා පිරිසිදු කිරීම ආදි කටයුතු වෙනුවෙන් 2022 ජූනි 14 සිට 2022 ජූලි 16 දක්වා කාලය තුල රු.101,320 ක වියදමක් ද ඇමදුම් සහල් එකතු කිරීම වෙනුවෙන් කවර මිල දී ගැනීම සඳහා 2022 ජූනි 03 සිට 2022 සැප්තැම්බර් 12 දක්වා කාලය තුල රු.787,520 ක වියදමක් ද දරා තිබුණි. | ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි එච්. එම්.මැන්පවර් වෙතකැඩුණු සහල් මලු සැකසීම ,දුම්රිය ගබඩා පිරිසිදු කිරීම, ආදී කටයුතු වෙනුවෙන් රු.101 320/-ක මුදලක් ද, ඇමදුම් දහල් එකතු කිරිම වෙනුවෙන් රු 787,520/- ක මුදලක් දරා ඇති බව දන්වා සිටිමි. | හානි වලක්වා ගැනීමට කටයුතු කල යුතුය. |

**(ඈ) තොග හානි වීම් හා ඌණතා**

| | | | |
|---|---|---|---|
| (i) | අදියර I,II හා III යටතේ නෞභාරපත අනුව ලද සහල් ප්‍රමාණය කිලෝග්‍රෑම් 40,000,000 ක් වුවද වරායෙන් නිදහස් කරගත් ප්‍රමාණය කිලෝග්‍රෑම් 39,960,350 ක් වුයෙන් කිලෝග්‍රෑම් 39,650 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. එසේම ඔරුගොඩවත්ත හා මරදාන ගබඩා වෙත ලද සහල් ප්‍රමාණය කිලෝග්‍රෑම් 39,957,650 ක් වුයෙන් වරායෙන් නිදහස් කරගත් ප්‍රමාණය හා ගබඩා වෙත ලැබුණු සහල් ප්‍රමාණය අතර කිලෝග්‍රෑම් 2700 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. ඊට අමතරව අදියර තුනේදීම නැවෙන් ඇමඳුම් කරන ලද සහල් කිලෝග්‍රෑම් 42,300 ක් ද නැවත පිරිසිදු කර බෙදාහැරීමේ පදනම මත පැවතිණි.අදියර තුනේදීම නෞභාර පත්‍ර හා වරායෙන් නිදහස් කර ගත් කිරිපිටි ප්‍රමාණයන් වෙනස් වූ අතර ඌණතාවය කි.ග්‍රෑ.6840 ක් විය. | නෞභාර පතේ සඳහන් සහල් ප්‍රමාණය කි.ග්‍රෑ. 40 000 000 වුවද ,සහල් මළුකැඩී නැව තුළ විසිරී යාම හේතුවෙන් වරායෙන් නිදහස් කර ප්‍රමාණය වරාය සටහන් ලේඛ න අනුව කි.ග්‍රෑ39 960 350 ක් විය.වරායේ සිට මරදාන න හා ඔරුගොඩවත්ත ගබඩා වෙත ප්‍රවාහනයේ දී මෙම සහල් මලු ලොරි රථ වලට පැටවීමේ දි හා බෑමේ දී කැඩී විසිරී යාම් ආදියෙන් ගබඩා වෙත ලැබී තිබූ ප්‍රමාණය ගබඩා ලේඛණ අනුව කි.ගෑ.39 957 650 ක් විය. | තොග අපතේ යාම අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | අදියර I,II හා III යටතේ දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත බෙදා හරින ලද සහනාධාර හා එම කාර්යාල වෙත ලද සහනාධාර අතර සහල් කි.ග්‍රෑ. 10,910 ක ද, | ආහාර දෙපාර්තමේන්තුවේ සීමිත කාර්ය මණ්ඩලයක් යොදා ගෙනදිවා රාත්‍රී දෙකේ රාජකාරී ඉටු කළ අතර මෙම වෙනසට හේතුව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් භාර ගැනීමෙදී ගනනය කිරීමේදී | ගණනය කිරීමේ දෝෂ අවම කිරීමටද සැසඳීම් සිදු කර නිවැරදි කිරීමට ද කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරිපිටි කි.ග්‍රෑ. 160 ක ද ඌනතාවයක් නිරීක්ෂණය විය. | දෝශයන් විය හැකි අතර එම දෝශයන් දාහකට තුනක් පමණ බව නිරීක්ෂනය වන අතර අඩු වීමේ දෝෂයක් නොව මානව ගණනය කිරීමේ දෝෂ විය හැකිය.<br>ඉදිරියේදී මේ සම්බන්ධයෙන් පරීක්ෂාකාරී වීමට සටහන් කර ගතිමි. | |
| **(ඇ)** | **බෙදා හැරීමේදී තොග අතිරික්තතා ඇති වීම**<br>ප්‍රවාහනය කල තොගයට වඩා වැඩි ප්‍රමාණයක් ලද බවට දිස්ත්‍රික් ලේකම් තහවුරු කර තිබුණු අවස්ථා නිරීක්ෂණය වූ අතර ඒ අනුව අතිරික්ත ලැබීම් සහල් කි.ග්‍රෑ. 4150 ක් වී තිබුණි. ඒ අනුව නිසි අධික්ෂනය සහ පරීක්ෂාව යටතේ බෙදාහැරීම සිදු කලේද යන්න විගණනයට ගැටලු සහගත විය. | භාණ්ඩ භාර දීම සහ භාර ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදය වන්නේ දිස්ත්‍රික් ලේකම් හෝ නියෝජිතයෙකු හෝ කොළඹට ගෙන්වා අදාල නිලධාරියා ඉදිරියේ භාණ්ඩ ගැලට පටවා ඔහුට භාර දීමය. එහෙත් පැවති ඉන්ධන අර්බුදය හමුවේ රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුව රාජ්‍ය නිලධාරීන් සංසරණය සීමා වූ නිසා රාජ්‍ය නිලධාරීන් කොළඹට ගෙන්වා භාණ්ඩ භාර දීම සිදු නොකළ අතර එය රජයේ වියදම් අවම කිරීමේ ක්‍රියා මාර්ගයක් හා චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කර තිබෙන බව දන්වමි. දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සෘජුවම භාණ්ඩ භාර ගැනීමට කටයුතු කරන ලදී. | සහනාධාර බෙදාහැරීමේදී නිසි අධික්ෂණය සහ පරීක්ෂාව යටතේ සිදුකළ යුතුය. |
| **(ඈ)** | **බෙදා හැරීමේ වියදම්** | | |
| (i) | මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහල් මෙට්‍රික් ටොන් 05 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 7.5 ක් ප්‍රවාහනය කර තිබුණ ද ඒ සඳහා ප්‍රවාහන වියදම ගණනය කිරීමේදී සහල් මෙට්‍රික් ටොන් 20 ක් හා කිරිපිටි මෙට්‍රික් ටොන් 25 ක් බෙදාහැරි බව සඳහන් කර ප්‍රවාහන වියදම් ගණනය කිරීම නිසා රු.298,024 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වියදම් සහතික කිරීමේදී නිසි අධීක්ෂණයක් පැවතිය යුතුය. |
| (ii) | මෙට්‍රික් ටොන් එකක් කිලෝමීටර් එකක් ප්‍රවාහනය කිරීමට රු.35 ක් අය කිරීමට ප්‍රසම්පාදන තිරණයකට එළඹ තිබුණු අතර කිරිපිටි ප්‍රවාහනයේදී ප්‍රවාහනය කල | ආහාර කොමසාරිස්තුමියගේ අනුමැතිය මත ලොරි ධාරිතාවය මත මෙම ප්‍රවාහන ගාස්තු ගෙවා ඇත. | ප්‍රසම්පාදන තිරණයට අනුව ගෙවීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මෙට්‍රික් ටොන් ප්‍රමාණයට වඩා වැඩියෙන් එනම් ලොරියේ ධාරිතාවයට ගෙවා තිබුණු අවස්ථා විය. පරීක්ෂා කල නියැදියට අනුව වැඩිපුර ගෙවා තිබුණු ප්‍රවාහන ගාස්තුව රු.771,308 ක් විය. | | |
| (iii) | තෝරාගත් පෞද්ගලික සමාගම බෙදාහැරීම සඳහා ප්‍රවාහන ගාස්තු දැරීමට එකඟ වී තිබියදීත් වෙනත් පෞද්ගලික ප්‍රවාහන සේවා වෙතින් බෙදාහැරීමේ සේවා ලබා ගැනීම නිසා රු.457,494 ක් වැඩිපුර මුදල් ගෙවීමට සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් තෝරා ගන්නා ලද ආයතන මගින් දිස්ත්‍රික්ක වල බෙදාහැරීමේ කටයුතු සිදු කරන ලදී . පැවති වාතාවරණය අනුව ගබඩා වල ඉඩ ප්‍රමාණයන්පිළිබඳ ගැටලු නිරාකරණය කර ගැනීමත් ,අහාර ද්‍රව්‍ය කඩිනමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යැවීමේ අවශ්‍යතාවයක් ඇති වූ හෙයින්ද, ආහාර කොමසාරිස් ගේ ඉල්ලීම මත ඉන්ටර්මැරින් ආයතනය විසින් කලුතර දිස්ත්‍රික්කයේ සහනාධාර බෙදාහැරීමේ කටයුතු සිදු කරන ලදී. නමුත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් තෝරා ගත් ආයතන තුලින් අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා ප්‍රවාහන කටයුතු සිදු කරන ලදී. | අවම පිරිවැයක් යටතේ වියදම් දැරිය යුතුය. |
| (iv) | නිශ්කාශන වියදම් වලට අදාලව මිල කැඳවීම් අනුව එකඟ වූ ඒකක පිරිවැය ගණනය කිරීමට අදාල වූ වියදම් අයිතමවලට අමතරව වෙනත් වියදම් ලෙස අදියර I,IIහා III සඳහා රු.1,429,828 ක වියදමක් ගෙවා තිබුණි. ඒ අනුව ඒ තුල ඇතුලත් වූ රු.540,979 ක වරාය ගාස්තු හා රු.729,532 ක රේගු බදු වලට අමතරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වරාය ගාස්තු හා රේගු බදු ලෙස පිළිවෙලින් රු.9,495,008 ක් හා රු.9,651,650 ක් ගෙවා තිබුණි. | පිළිතුරු ලැබී නොතිබුණි. | මිල කැඳවීම් අනුව එකඟ වූ මිල ගණන් වලට අනුව ගෙවීම් සිදුකළ යුතුය. |

**2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතික වීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික වියයුතු වුවත්. වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | වැඩ බැලීමේ පදනම මත හෝ අභ්‍යන්තර විගණක වරයෙක් පත් කර ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | පනතේ අවශ්‍යතාවය අනුව කටයුතු කල යුතුය. |

**2.5 නීති,රිති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| **(i)** | මුදල් රෙගුලාසි 138(1) | 1,041,797 | වවුචර් පත්‍රයක් සහතික කිරීමේදී අදාල ශීර්ෂය, වැඩසටහන, ව්‍යාපෘතිය, ව්‍යාපෘති පංතිය යනාදිය නිවැරදිව අදාල ගිණුමට වැය බරක් වන බවට අදාල නිලධාරියා සහතික විය යුතු වුවද එසේ සහතික කිරීමෙන් තොරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට ඉන්දියානු ආධාර බෙදාදීම සඳහා අතිකාල ලබා දීමට අවකාශ නොතිබියදී ආහාර කොමසාරිස්ගේ | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉන්දිය සහනාධාර බෙදීමේ කටයුතු වල නියලීම හා ඉතා සීමිත කාර්ය මණ්ඩලයකින් මෙම කාර්යන් ඉතා කඩිනමින් ඉටු කරවා ගැනීම නිසා එලෙස අතිකාල ආහාර දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයෙන් 300 - 1-1-1002 වැය විෂය යටතේ ගෙවීම් කර ඇති බව දන්වා සිටිමි.ඉදිරි අතිකාල ගෙවීම් වලදී ඔබගේ උපදෙස් පරිදි ක්‍රියා කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | (300) වැය ශීර්ෂයේ 1002 වැය විෂයය යටතේ මැයි, ජුනි සහ ජූලි මාස 3 සඳහා රු.1,041,797ක් අතිකාල දීමනා සඳහා ගෙවීම් කර තිබුණි. | | |
| **(ii)** | මුදල් රෙගුලාසි 371 (2) (ආ) | 895,000 | තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාදිය හැක්කේ මාණ්ඩලික නිලධාරින්ට පමණක් වුවද රු.895,000 ක් වටිනා අත්තිකාරම් මුදල් මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා නිකුත් කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් (විධායක නිලධාරීන්) ලෙස සේවය කරනු ලබන්නේ ආහාර කොමසාරිස් ප්‍රධාන ගණකාධිකාරී පමණක් වන අතර ඉන්දියාවෙන් හා චීනයෙන් මෙරටට ලද පරිත්‍යාග කාර්යක්ෂමව සහ ඉක්මනින් ලබා දීම සඳහා එක්එක් ස්ථානනයට අනුයුක්ත කර සිටි ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් වෙත අත්තිකාරම් මුදල් ලබා දීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.6 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු වලට අදාළව රු.110,095,143 ක ශේෂයක් වූ අතර එම ශේෂ තුල වර්ෂ 02 ත් 10 ත් අතර රු.54,930,690 ක් හා වර්ෂ 10 ට වැඩි රු.25,448,939 ක ශේෂයක් විය. ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එම ශේෂයන් පරීක්ෂා කර බලා මු.රෙ 571 ට ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට උපලබ්ධි නොවූ ලැබීම් රු.887,592 ක් පැවති අතර ඒ තුල වසර 07 ඉක්ම වූ රු.55,000 ක ශේෂයක් ද පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | උපලබ්ධි නොවූ ලැබීම් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂ දෙකකට අධික හඳුනා නොගත් ලැබීම් රු.36,650 ක් ද ,වසරකට අධික රු.31,775 ක් ද හා මාසයකට අධික රු.1,353,885 ක් ද වශයෙන් මුළු එකතුව රු.1,442,310 ක් වූ හඳුනා නොගත් ලැබීම් පැවති අතර එම ලැබීම් හඳුනා ගැනීමට විගණිත දිනය වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | හඳුනානොගත් ලැබීම් නොපමාව තහවුරු කරගෙන ගිණුම්ගත කිරීම කඩිනමින් සිදු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අදාලව නිකුත් කල මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් විය යුතු වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි. | • ඉදිරියේ දී ක්‍රියාකාරී සැලැස්ම සමග වාර්ෂික අක්මුදල් සැලැසුමද ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි.<br>• අභ්‍යන්තර විගණන අංශයක් මෙම දෙපාර්තමේන්තුවේ දැනට ස්ථාපිත කර නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව සැලසුම් සකස් කිරීමට වගබලා ගත යුතුය. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තොරතුරු තාක්ෂණ ශාඛාව මඟින් මහජනතාවට යාවත්කාලීන තොරතුරු සැපයීම අරමුණු කරගෙන දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුව යාවත්කාලීන කිරීම ක්‍රියාකාරී සැලැස්ම තුලින් හඳුනාගෙන තිබුණ ද විගණිත දින වන විටත් දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුව නිසි පරිදි යාවත්කාලින කර නොතිබුණි. | දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම මේ වන විට සිදු කරමින් පවතින අතර, එය කඩිනමින් යථා තත්වයට පත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වෙබ් පිටුව නිසි පරිදි යාවත්කාලීන කළ යුතුය. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යයන් ලෙස දක්වා ඇති මෙට්‍රික් ටොන් 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම හා මෙට්‍රික් ටොන් 100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම සඳහා 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් 300-1-1-3-2506 හා 300-1-1-4-2506 යන වැය විෂයයන් වෙනුවෙන් වෙන් කර තිබූ රු.100,000,000 ක මුළු ප්‍රතිපාදනයම වර්ෂය අවසානය වන විට ද ඉතිරි වී තිබුණි.එසේ පැවතියදී කාර්යසාධන වාර්තාවේ 300-1-1-4-2506 යන වැය විෂයය යටතේ වූ කාර්යසාධන දර්ශකය යටතේ වූ වෙළඳපොල සහල් සුලභතාවය වෙනුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ගේ සහල් නිෂ්පාදනය කිරීමේ වැඩසටහන අධීක්ෂණය කිරීම මඟින් වෙළෙඳපොළ තුල සහල් සුලභතාවය පවත්වා ගැනීම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිඵලයක් ලෙස තත්‍ය නිමැවුම සියයට 75 – 89 අතර පරාසයක දක්වා තිබුණු අතර, ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය යටතේ සියයට සියක් ලෙස දක්වා තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය නිවැරදි කිරිමට කටයුතු කරමි. | නිවැරදිව ප්‍රගතිය සකස් කිරීමට වගබලා ගත යුතු අතර කාර්ය සාධන වාර්තාවේ නිවැරදි දත්ත දැක්වීමට කටයුතු කළ යුතුය . |
| (ආ) | දෙපාර්තමේන්තුවේ සම්පත් මනා කළමනාකරණය සඳහා අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු යටතේ ගබඩාවන් සහ නිවාස කුලියට ලබා දීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වය දැක්වීම සියයට 100 ක සිට සියයට 90 ක මට්ටමේ හඳුනාගෙන තිබුණ ද 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ගබඩා කුලී රු.95,448,000 ක් හා හිඟ නිවාස කුලී රු.8,763,133 ක් පැවතුණි. | හිඟ ගබඩා කුළී හා හිඟ නිවාස කුලී අයකර ගැනීමට කටයුතු කරමින් කරමි. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජුනි 26 සිට 2019 දෙසැම්බර් 26 දක්වා මාස 06 ක කොන්ත්‍රාත් කාලයකට දඹුල්ල උෂ්ණත්ව පාලක ගබඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා ගිවිසුම් ගතව පැවතියද කොන්ත්‍රාත්තුව නිමකල යුතු දිනයෙන් වර්ෂ 03 ක් ඉක්මවා ගිය ද අදාල ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කර නොතිබුණි. 2022 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තුල 2022 අප්‍රේල් 30 දින වැඩ අවසන් කිරීමට නියමිත බවත් එය ප්‍රමුඛතා කටයුත්තක් ලෙසත් දක්වා රු.මිලියන 625 ක් ඇස්තමේන්තු කර තිබුණි.2022 වාර්ෂික ඇස්තමේන්තුවේ ඒ වෙනුවෙන් දේශීය අරමුදල්, විදේශ ප්‍රදාන හා විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය වැය විෂයය 2104 යටතේ රු.246,000,000 ක් ඇස්තමේන්තු ගත කර තිබුණ ද දේශිය අරමුදල් සහ විදේශ ප්‍රදාන යටතේ වූ රු.205,400,000 ශුද්ධ ප්‍රතිපාදනය 100% ක් ද විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැයට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් 99% ක් එනම් රු.39,128,224 ක් ද ඉතිරි වී තිබුණි. මෙලෙස පැවතිය දී 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රසම්පාදන ප්‍රගතිය යටතේ සියයට 80 ක ප්‍රගතියක් දක්වා තිබුණි. | තාක්ෂණික ගැටලු මත එලෙස ව්‍යාපෘතිය ප්‍රමාද වී ඇති අතර 2023 වර්ෂයේ දී නිම කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතියට අදාල 2022 12.31 දිනට ප්‍රසම්පාදන ප්‍රගතිය නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ප්‍රගතිය ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. |

### 3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.2 ඡේදයට අදාලව නිකුත් කර ඇති මාර්ගෝපදේශ අංක 14 අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි 03 වන පරිච්ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කල යුතු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. තවද 04 පරිච්ඡේදය ප්‍රකාරව ආයතනයේ කාර්යසාධන දර්ශක ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඉදිරිපත් කළ යුතු වුවත් එලෙස සකස් කර නොතිබුණි. | ප්‍රමාද දෝෂයකින් 2022 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවේ කෙටුම්පත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නැති අතර ඉදිරියේදී රජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතුව වාහන 11 ක් පැවතිය ද වාහන 09 ක් පමණක් සිගාස් වත්කම් ලේඛණයේ ඇතුලත් කර තිබුණි. | අතපසුවීමකින් ස්ථාවර වත්කම් ලේඛණයේ WY-9165 දරණ මෝටර් සයිකලය සහ PG-9165 අංක දරණ කැබ් රථය ඇතුලත් කර නොතිබූ අතර ඒවා ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කිරීමට කටයුතු කරමි. | නිවැරදි වත්කම් තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක් වසර 05 කට අධික කාලයක සිට භාවිතයේ නොපැවති අතර එම වාහන සම්බන්ධයෙන් 2020 ඔක්තෝම්බර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාහන අපහරණ කටයුතු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කඩිනමින් සිදුකරන බව කාරුණිකව දන්වමි. | භාවිතයේ නොපවතින වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික්ක 15 ක දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් හා ගොඩනැඟිලි 28 ක් තවදුරටත් තක්සේරු කර නොතිබුණි. | වත්කම් තක්සේරු කිරීම සඳහා පත් කරන ලද මණ්ඩලයේ නිළධාරීන් ස්ථාන මාරු වීම් හා විශ්‍රාම යාම මත ඉවත් වී ඇති බැවින් , අදාල රාජකාරී කටයුතු ඉතා ඉක්මනින් නිම කිරීමට සටහන් කර ගතිමි. | වත්කම් සියල්ල තක්සේරු කිරීමට වගබලා ගත යුතුය. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ධානායගම නිවාස සංකීරණය පිළිබඳ පරීක්ෂාව**<br>(i) නිවාස 366 ක නිවාස සංකිර්ණයක් වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මහින් තනවා 1981 | ඉඩම පවරා ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. | කඩිනමින් ඉඩම පවරා ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | නොවැම්බර් 21 දින ආහාර හා සමුපකාර අමාත්‍යාංශය වෙත නිල වශයෙන් භාර දී තිබූ මෙම ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ ඉඩම විගණිත දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | | කළ යුතුය. |
| | (ii) ඉහත නිවාස 366 න් නිවාස 26 ක් අබලන් තත්ත්වයේ පැවති අතර එම නිවාස වලින් නිවාස 09 ක් අවුරුදු 10 කට අධික කාලයක් තිස්සේ අබලන්ව තිබිය ද අලුත්වැඩියාවන් සිදුකර නොතිබුණි. | නිවාස 26 ක් අබලන් තත්වයේ පැවතියද ආර්ථික වශයෙන් ඵලදායිතාවයක් නොමැති බැවින් ප්‍රමාද වී ඇත. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා කටයුතු තීරණයක් ගැනිමට කටයුතු කරමි. | නිසි පරිදි නඩත්තු කටයුතු සිදු කිරීමට වගබලා ගත යුතුය. |
| | (iii) 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂ 5 කට වරක්ම ඉඩම් හා ගොඩනැඟිලි තක්සේරු කල යුතු වුවත් ධාන්‍යාගම නිවාස සංකිර්ණයේ නිවාස අවසන් වරට තක්සේරු කර තිබුණේ 2017 මැයි 15 දිනදීය. | නිවාස තක්සේරු කිරිමට කටයුතු කරමි. | වත්කම් නිසි පරිදි තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | දෙපාර්තමේන්තුව සතුව මෙට්‍රික් ටොන් 265,035 ක ධාරිතාවයකින් යුත් ගබඩා 103 ක් පැවති අතර 2022 දෙසැම්බර් 31 දිනට එම ගබඩා හා දෙපාර්තමේන්තුව සතු ගොඩනැඟිලි වලට අදාලව රු.95,448,000 ක හිඟ කුලී පැවතුණි. එයින් රු.42,876,740 ක් දෙපාර්තමේන්තුව දැනට කුලියට ලබා දී තිබුණු බදුකරුවන් 23 දෙනෙකුගෙන් ලැබිය යුතුව පැවතුණු අතර, රු.52,571,260 ක් කුලියට ලබා දී නැවත පවරාගෙන තිබු ගබඩා සම්බන්ධයෙන් විය. තවද බදුකරු කුලී මුදල් ගෙවීම පැහැර හැරීමක් සිදු වූ විට බදු ගිවිසුම අනුව පරිශ්‍රය නැවත පවරා ගැනීමේ හැකියාව බදු දීමනාකරු සතු වුවද දිගින් දිගටම බදු මුදල් ගෙවීම පැහැර හරින ලද ඉහත බදුකරුවන් 23 සම්බන්ධව එලෙස ක්‍රියාකර නොතිබුණි. | මෙම ගබඩා බොහොමයක් රාජ්‍යය ආයතන සඳහා කුළියට ලබා දි ඇති අතර දැනට ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | ආපනශාලා ගොඩනැඟිල්ල 2019 අගෝස්තු 15 සිට 2022 අගෝස්තු 14 දක්වා පුද්ගලික සමාගමක් වෙත බදු දීම සඳහා පළමු දෙවන හා තෙවන වර්ෂ සඳහා පිළිවෙලින් රු.131,000 , රු.139,400 , රු.156,000 ක මාසික බදු කුලියකට ගිවිසුම්ගතව තිබුණි. ඒ අනුව වසර 3 සඳහා රු.5,116,800 ක කුලී මුදලක් ලැබිය යුතු වුවද, 2020 දෙසැම්බර් 01 | ආපන ශාලාව වෙනත් පර්ශවයක් වෙත පැවරිමට 2023.07.31 දිනටපෙර ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරනු ලැබේ. | ප්‍රමාදයකින් තොරව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සිට 2022 නොවැම්බර් 30 දක්වා පමණක් රු.2,966,000 ක ඉන්වොයිස් නිකුත් කර තිබු අතර එයින් ද රු.2,443,000 ක් හිඟ කුලී ලෙස පැවතුණු අතර ගිවිසුමේ 28 වන ඡේදය උල්ලංඝණය කිරීම හේතුවෙන් ගිවිසුම අවලංගු කිරීමට ක්‍රියාකර නොතිබුණි. 2022 ඔක්තෝම්බර් 22 දින ආපනශාලාව සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පොලිසියට පැමිණිල්ලක් සිදුකර ආපනශාලාව මුද්‍රා තබා තිබුණි. මේ වනතුරුත් හිඟ කුලී අයකරගෙන නොතිබු අතර ආපන ශාලාව වෙනත් පාර්ශවයක් වෙත ලබාදීම සඳහා ප්‍රසම්පාදන කටයුතු හෝ ආරම්භ කර නොපැවතුණි. | | |
| **(ඇ)** | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2021 යටතේ වූ මාර්ගෝපදේශ 01 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ ලබා දී ඇති ණය මුදල් අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4,4.2.4 හා 4.2.5 වගන්ති ප්‍රකාරව කටයුතු කර තවදුරටත් කල්ගත වූ ණය ශේෂ සම්බන්ධයෙන් මාර්ගෝපදේශයේ (ඉ) ඡේදය ප්‍රකාරව කටයුතු කර තවදුරටත් අයකර ගත නොහැකි ණය ශේෂ පවතී නම් මාර්ගෝපදේශයේ (ඊ) ඡේදය ප්‍රකාරව අදාළ ක්‍රියාමාර්ග ගත් බවට සහතික කළ හැකි ලේඛණ ද සමඟ හිඟ ණය ශේෂ අත්හැරීම සඳහා මුදල් රෙගුලාසි 113 යටතේ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්/භාණ්ඩාගාර ලේකම් වෙත යොමු කිරීම සඳහා වන ඉල්ලීමක් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුය. එසේ කිරීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් මියගිය, විශ්‍රාම ගිය, සේවය අත්හිටවු සහ සේවය හැරගිය නිළධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ වල එකතුව රු.1,387,731 ක් තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය තුල දක්වා තිබු අතර ඒ තුල වසර 1-2 අතර රු.346,500 ක ණය ශේෂ ද පැවතිණි. | මිය ගිය පී.කේ.නිහාල් මයාගේ විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමට ද කිසිවෙකු ඉදිරිපත්වී ට නැත. රු.154,130.31 ක හිග ණය ශේෂයට ඇප වී ඇත්තේ ජාතික රක්ෂණ භාර අරමුදලයි.මේ පිළිබද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතද තොරතුරු ලබා දී ඇත.<br>අවු.15 කට වඩා වැඩි ණය ශේෂ පවතින නිලධාරින් කිහිපදෙනෙකුගේම පෞද්ගලික ලිපිගොනු සොයා ගත නොහැකි බැවින් හිග ණය ශේෂ අත්හැරීම සඳහා මුදල් රෙගුලාසි 113 යටතේ කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.<br>එස්.මල්වාන මයාගේ ණය ශේෂ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තු වෙත දැනුම් දී ඇත.<br>තවද වසර 1-2 අතර ණය ශේෂ පවතින ටී.එම්.ජී.ඉන්දික මයාගේ ඇපකරු වන ඊ.ජී.සිරිපාල මයා මේ වන විට විශ්‍රාම ගොස් ඇති අතර ඩී.එම්.ප්‍රියන්ත මයාගේ ඇපකරු මෙම දෙපාර්තමේන්තුවේ වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ මුරකරු ලෙස සේවය කරන ඩබ්.ආර්.එම්.යූ.අමරසිංහ මයා බව පාලන අංශයෙන් දැනුවත් කර ඇත.ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබයි. | ණය ශේෂ කඩනමින් අයකර ගත යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) සහ 40 (2) වගන්ති ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | වැඩ බැලීමේ පදනම මත හෝ අභ්‍යන්තර විගණක වරයෙක් පත් කර ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |